247

පූර්ලංකා

# ශුද්ධ වූ මතෙව් විසින් ලියන ලද සුවිශේෂයේ පාලි පරිවර්තනය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක්

කැලණිය විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධිකාව

(2001 මැයි)


| ප්‍රවේශ අංකය | 247 |
| --- | --- |
| වර්ග අංකය | |


කුඹල්ගොඩ ධම්මාලෝක හිමි.
H/ M. Phil/ Pali/ 99/ 04,
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය,
කැලණිය විශ්ව විද්‍යාලය,
ශ්‍රී ලංකාව.

# සාරාංශය

ක්‍රි. ව. 1934 දී පාලි භාෂාවට පරිවර්තනය කරන ලද ශුද්ධ වූ බයිබලයේ මතෙව්ගේ සුවිශේෂයේ පාලි පරිවර්තනය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යනයකි. වෙසෙසින්ම අප මෙහිදී පරිච්ඡේද පහකින් යුතුව මෙම නිබන්ධිකාව නිමාකර ඇත. ඒ අනුව මෙහි ප්‍රථම පර්ච්ඡේදය නම් කර ඇත්තේ "මානව වර්ගයා හා ආගම්" යනුවෙනි. මෙහිදී මානව සංහතියේ ආරම්භයේ දී ආගම කෙසේ පැවැතුනි ද? මානව වර්ගයා හා ආගම අතර පවතින සම්භන්ධතාවය කෙබඳු වුවක් දැයි විස්තර කර ඇති අතර ආගම පිළිබඳ විවිධ දාර්ශනිකයන් දක්වා ඇති අදහස් පිළිබඳ සාකච්ඡා කර ඇත. මෙහි දී අප ආ නිගමනය වන්නේආගම මානව වර්ගයාගෙන් කිසිසේත් වෙන්කර තැබිය නොහැකි බවයි.

අනතුරුව විසි වැනි සියවසේ තිහේ දශකයේ පාලි භාෂාවේ තත්වය පිළිබඳ අධ්‍යයනය කර ඇත. වර්ෂ 1930 - 1940 දශකයේ ලංකා පාලි සාහිත්‍යය ඉතා දියුණු තත්වයක පැවති බවට බොහෝ සාධක දක්වා ඇති අතර තත් කාලය තුළ රචිත පාලි පොත් සොයාගත හැකි වූ සියල්ලම පිළිබඳ මෙහි ඇතුළත් කර ඇත. තවද මෙම කාලය තුළ දී ග්‍රන්ථකරණයේ නියුක්ත කතෘවරුන් පිළිබඳ ව ද විස්තර සපයා ඇත. එමෙන්ම බයිබල් සාහිත්‍යයට අදාළව ලංකාවේ දී රචිත විවිධ සාහිත්‍යයන් පිළිබඳ තොරතුරු ද ඇති අතර බයිබල් සාහිත්‍යය ගැන විස්තර ඇතුළත් ය. සිංහල, පාලි, සංස්කෘත භාෂා සාහිත්‍ය ග්‍රන්ථ පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් සපයමින් ක්‍රිස්තියානි සාහිත්‍යය ගැනද හැඳැරීමක් සිදු කර ඇත.

අනතුරුව බෞද්ධ හා ක්‍රිස්තියානි ඉගැන්වීම් පිළිබඳ සම විසමතා අධ්‍යයනයත් කර ඇත. ඒ. අනුව පෙළ දහමේ ඇති යම් යම් සංකල්ප හා බයිබලයේ ඇති එවන් සංකල්ප පිළිබඳ අධ්‍යයනය වැදගත් වේ. බුදුන්වහන්සේගේ දේශනා ඒ වූ පරිදිම බයිබලයේ තිබෙන බවට මෙහි තුන් වැනි පරිච්ඡේදයේ දී සාධක සහිතව ඇතුළත් කර ඇත. එසේ සම අදහස් කීපයක්ම ඇතුළත් කර ඇති අතර දාර්ශනික වශයෙන් විසම තත්වයට පත්වන අදහස් ද ඇතුළත් කර ඇත. සැබවින්ද මෙහි දී නිගමනය වන්නේ සදාචාරමය ලෙස ආගම් දෙකෙහිම ශාස්තෘවරු එක සමාන අදහස් දැරුව ද දාර්ශනික අංශයෙන් ඉතාම පරස්පරතා ඇති බවයි. බුදු දහාම් උගන්වන චතුරාර්‍ය සත්‍යය, පටිච්චසමුප්පාදය, ත්‍රි ලක්ෂණය වැනි ගැඹුරු දාර්ශනික සිද්ධාන්ත බයිබලයෙන් සොයාගත නොහැකිය. ඒ නිසාවෙන් දාර්ශනික අදහස් වලින් මෙම සමයයන් දෙක මොවතක යනු ඇත.

බුද්ධ චරිතය හා ක්‍රිස්තු චරිතය පිළිබඳ චරිතමය අධ්‍යනයකින් හමුවන්නේ

මෙම දෙදෙනා වහන්සේම ඓතිහාසික පුද්ගලයන් වන බවයි. එහෙත් වෙන් වෙන් ලෙස සොයා බලන කල චරිත වාර්තා කර ඇති මූලාශ්‍රවල යම් යම් වෙනස්කම් හා සැක සංකා ඇති බවයි. සිද්ධාර්ථ ගෞතම චරිතය පිළිබඳව වාර්ථාවන පැරණි මූලාශ්‍රයවල අන්තර්ගත තොරතුරු සාම්ප්‍රදායික ඉගැන්වීම් වලට ප්‍රති විරුද්ධ වන අතර බෞද්ධ නිකායාන්තර සාහිත්‍යයන් තුළින් ද එවන් විසමතා දකිය හැකිය. එහෙත් ථෙරවාදී ත්‍රිපිටකය තුළින් පිරිසිදු බුද්ධ චරිතය ගම්‍ය වේ.

ක්‍රිස්තු චරිතය පිළිබඳව ද ඇත්තේ ඊටත් වඩා සංකීර්ණ වූ තත්වයකි. ඒ අනුව එතුමන්ගේ ජීවිතයේ වසර 13 ක කාලයක් බයිබලයේ වාර්තා නොවන බැවින් නූතන පර්යේෂකයන් දක්වනක ලද අදහසක් වන ක්‍රිස්තුස් වහන්සේ බෞද්ධ භික්‍ෂුවකැයි පවත්නා අදහස ද ඇතුළත්ව ඇත. බුදු සිරිත හා ක්‍රිතු සිරිත සමාන කිරීමට පසුකාලීන උගතුන් දරා ඇති ප්‍රයත්නයන් පිළිබඳව ද මෙහි සටහනක් කර ඇත.

මෙම නිබන්ධිකාවේ 5, 6 පරිච්ඡේද මඞගලවුත්තනය පෙළ කොටස හා එහි සිංහල පරිවර්තනය ඇතුළත්ව ඇත. ඒ අනුව මෙහි සවැනි පරිච්ඡේදය සිංහලයට පරිවර්තනය කිරීමේදී ශුද්ධ වූ බයිබලයේ අලුත් ගිවිසුමේ සිංහල පරිවර්තනය ද උපකාරී කර ගතිමි.

මෙසේ සැකසී ඇති මෙම නිබන්ධිකාව ආගම් අධ්‍යයනයට හා සාහිත්‍යය පෝෂණයෙහිලා යම් බඳු මෙහෙයක් වනු ඇතැයි සිතමි.